# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 30 දරන පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි

(1075 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි තැ. පෙ. අංක 500 දරන රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 30 දරන
පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 47/74.

ශ්‍රී ලංකාව තුළ පටපණු වගාව සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සඳහා සහ පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන රාජ්‍ය අධිකාරියක් පිහිටුවීම සහ එහි බලතල හා කටයුතු විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 30 දරන පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

### පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන අධිකාරිය පිහිටුවීම

2. (1) (මේ පනතෙහි "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබේ. පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් අධිකාරියට පැවරුණු නමින් ඒ අධිකාරිය සංස්ථාවක් වන්නේය. එයට අවිච්ඡින්න පැවැත්මක් ඇත්තේය. තවද ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරිය හැකිය. එම නාමයෙන් එයට විරුද්ධ ව නඩු පවරනු ලැබිය හැකිය.

3. (1) අධිකාරිය, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සංයුක්ත වන්නේය :— අධිකාරියේ සංයුතිය.

(i) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ii) කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(iii) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(iv) මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(v) සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයා ; සහ

(vi) වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ නියෝජිතයන් දෙදෙනෙක්.

(2) අමාත්‍යවරයා විසින් අධිකාරියේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු සභාපති ලෙස පත් කළ යුතුය.

4. අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත වන්නේය. අධිකාරියේ රැස්වීම්වල ගණපූරණය.

ජ 14646—13,945 (75/06)

අධිකාරිය අමාත්‍යවරයාගේ විධානවලට හා පාලනයට යටත් වන බව.

5. අධිකාරියේ බලතල හා කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය අමාත්‍යවරයාගේ විධානවලට හා පාලනයට යටත් වන්නේය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

6. ධුරයෙන් කලින් ඉවත් කරනු ලැබුව හොත් මිස හෝ ධුරය කලින් හිස් කළ හොත් මිස සෑම සාමාජිකයෙක් ම අවුරුදු පහක කාල පරිච්ඡේදයක් ධුරය දරන්නේය :

එසේ වුව ද ධුරයෙන් ඉවත් කරනු ලැබූ හෝ ධුරය හිස් කළ හෝ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සාමාජිකයෙක්, ඔහු ධුරයෙන් කලින් ඉවත් කරනු ලැබුව හොත් මිස හෝ ධුරය කලින් හිස් කළ හොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය දරන්නේය.

සාමාජිකයන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම.

7. (1) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් සාමාජිකයකු විසින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(2) සාමාජිකයකු ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම් කිසිම හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ඉවත් කළ හැකිය.

(3) අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙනත් කිසි හේතුවක් නිසා හෝ තම ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට සාමාජිකයකු තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් වැඩ බැලීම සඳහා වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(4) අධිකාරියේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

අධිකාරියේ රැස්වීම.

8. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව, අධිකාරිය විසින්, අධිකාරියේ රැස්වීම් පිළිබඳ සහ එම රැස්වීම්වල දී කෙරෙන කටයුතු පිළිබඳ ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකිය.

අධිකාරියේ රැස්වීම්වල මූලාසනය.

9. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින අධිකාරියේ සෑම රැස්වීමක ම මූලාසනය ඔහු විසින් දැරිය යුතුය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට, පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තෝරාගනු ලැබූ සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

(2) අධිකාරියේ යම් රැස්වීමක සභාපතිවරයාට තමාගේ ඡන්දයට අතිරේක ව තීරක ඡන්දයක් ද ඇත්තේය.

සාමාජිකයකුගේ පුරප්පාඩුවක් හෝ පත්වීමෙහි යම් දෝෂයක් හේතු කොට ගෙන අධිකාරියේ ක්‍රියා හෝ කටයුතු අවලංගු නොවන බව.

10. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකුගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතුය.

11. මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට සහ ප්‍රමාණයන් අනුව වූ පාරිශ්‍රමික අධිකාරියේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකිය. අධිකාරියේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

12. (1) අධිකාරියට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එය අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තාගේ භාරයේ තිබිය යුතුය. අධිකාරියේ මුද්‍රාව.

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය.

(3) අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ තැබීම, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට හෝ අත්සන් තැබිය යුතු අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ මිස, කරනු නොලැබිය යුතුය.

(4) අධිකාරියේ මුද්‍රාව තබනු ලැබූ සාධන පත්‍රවල හෝ ලේඛනවල හෝ නාම ලේඛනයක් අධිකාරිය විසින් තබා ගත යුතුය.

13. අධිකාරිය විසින් ඇති කර ගැනීමට අදහස් කර ඇති යම් ගිවිසුමක් පිළිබඳ ව කෙලින්ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධතාවක් ඇති යම් සාමාජිකයකු විසින් තමාගේ සම්බන්ධතාවේ ස්වභාවය අධිකාරියේ රැස්වීමක දී එළිදරව් කළ යුතුය. ඒ එළිදරව් කිරීම අධිකාරියේ වාර්තාවල සටහන් කළ යුතු අතර ඒ ගිවිසුම සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරනු ලබන යම් සලකා බැලීමකට හෝ තීරණයකට හෝ ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතුය. අධිකාරිය විසින් එළඹීමට යෝජිත ගිවිසුමක තමන්ට ඇති යම් සම්බන්ධතාවක් සාමාජිකයන් විසින් එළිදරව් කළ යුතු බව.

14. අධිකාරියේ සියලු සාමාජිකයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව සහ එම සංග්‍රහයේ කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබේ. අධිකාරියේ සාමාජිකයන් සහ සේවකයන් රාජ්‍ය නිලධරයන් වශයෙන් සැලකෙන බව.

15. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූල ව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතෙහි විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය. අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූල ව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

16. (1) මේ පනතේ විධිවිධානවලට යටත් ව, අධිකාරියේ කටයුතු හා ව්‍යාපාර පිළිබඳ අධීක්ෂණය, පාලනය සහ පරිපාලනය අධිකාරිය වෙත පවරනු ලැබේ. අධිකාරියේ කටයුතු හා ව්‍යාපාර පිළිබඳ අධීක්ෂණය, පාලනය හා පරිපාලනය අධිකාරිය වෙත පැවරෙන බව.

(2) අධිකාරියේ බලතල හෝ කටයුතු අතුරින් යමක් අධිකාරිය විසින් අධිකාරියේ යම් සාමාජිකයකු හෝ සේවකයකු හෝ වෙත පැවරිය හැකිය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සෑම තැනැත්තකු විසින්, තමා වෙත පවරනු ලැබූ බලය හෝ කටයුත්ත, අධිකාරියේ විධානයට හා පාලනයට යටත් ව ක්‍රියාත්මක කළ යුතුය ; නැතහොත් ඉටු කළ යුතුය.

## II වන කොටස

## අධිකාරියේ කටයුතු හා බලතල

අධිකාරියේ කටයුතු.

**17.** පහත සඳහන් කටයුතු අධිකාරියේ කටයුතු වන්නේය:—

(අ) මල්බෙරි සහ වෙනත් පටපණු ආහාර ශාක වගා කිරීම සහ පටපණු බිජ සහ පටපණු පිලා කෝෂ නිෂ්පාදනය ඇතුළු ශ්‍රී ලංකාවේ පටපණු වගාවේ සංවර්ධනය, අධිකාරිය විසින් ම හෝ යම් තැනැත්තකු නැතහොත් (සංස්ථාගත වූ හෝ නොවූ) පුද්ගල මණ්ඩලයක් සමග හවුලේ හෝ වැඩි දියුණු කිරීම, විධිමත් කිරීම සහ භාරගැනීම;

(ආ) පට සහ ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය, අධිකාරිය විසින් ම හෝ යම් තැනැත්තකු නැතහොත් (සංස්ථාගත වූ හෝ නොවූ) පුද්ගල මණ්ඩලයක් සමග හවුලේ හෝ වැඩි දියුණු කිරීම, විධිමත් කිරීම සහ භාරගැනීම;

(ඇ) අමු පට නිෂ්පාදනය සඳහා පටපණු පිලා කෝෂගත නූල් එතීම, අමු පටනූල් ඇඹරීම සහ කටින ලද පටනූල් නිෂ්පාදනය කිරීම අධිකාරිය විසින් ම හෝ යම් තැනැත් තකු නැතහොත් (සංස්ථාගත වූ හෝ නොවූ) පුද්ගල මණ්ඩලයක් සමග හවුලේ හෝ වැඩිදියුණු කිරීම, විධිමත් කිරීම හා භාරගැනීම;

(ඈ) පටරෙදි හා පටරෙදි නිෂ්පාදන වියීම, පාට කිරීම සහ වෙනත් ක්‍රමවලින් නිමහම් කිරීම අධිකාරිය විසින් ම හෝ යම් තැනැත්තකු නැතහොත් (සංස්ථාගත වූ හෝ නොවූ) පුද්ගල මණ්ඩලයක් සමග හවුලේ හෝ වැඩිදියුණු කිරීම, විධිමත් කිරීම සහ භාරගැනීම;

(ඉ) පටපණු බිජ, පටපණු පිලා කෝෂ, අමු පට, පට නිෂ්පාදන, පටරෙදි, පටරෙදි නිෂ්පාදන සහ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම අධිකාරිය විසින් ම හෝ යම් තැනැත්තකු නැතහොත් (සංස්ථාගත වූ හෝ නොවූ) පුද්ගල මණ්ඩලයක් සමග හවුලේ හෝ වැඩිදියුණු කිරීම, විධිමත් කිරීම සහ භාර ගැනීම;

(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 36 දරන පටපණු බිජ පනත ක්‍රියාවෙහි යෙදවීම;

(උ) මල්බෙරි සහ වෙනත් පටපණු ආහාර ශාක වැවීම, පටපණු වන් බෝකිරීම හා ඇතිකිරීම, පටපණු පිලා කෝෂගත නූල් එතීම, අමු පට නිපදවීම, අමු පටනූල් ඇඹරීම, කටින ලද පටනූල් නිපදවීම සහ පටරෙදි, පටරෙදි නිෂ්පාදන සහ ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම පිළිබඳ පර්යේෂණ හා පරීක්ෂණාත්මක හැදෑරීම් වැඩිදියුණු කිරීම සහ භාර ගැනීම;

(ඌ) උපදේශක සහ ව්‍යාප්ති සේවයක් සැපයීම සහ පවත්වා ගෙන යාම;

(එ) ශ්‍රේණිගත කිරීමේ සහ ඇසිරීමේ ප්‍රමිති නියම කිරීම සහ බලාත්මක කිරීම ;

(ඒ) වෙළඳපොළවල් පිළිබඳ පර්යේෂණ කටයුතුවල, වෙළඳාම වැඩිදියුණු කිරීමේ වැඩ පිළිවෙළවල් පිළිබඳ කටයුතුවල, ප්‍රචාරක කටයුතුවල සහ තොරතුරු සම්පාදක කටයුතුවල යෙදීම ;

(ඔ) පූර්වයෙන් ආ ඡේදවල විස්තර කරන ලද කටයුතුවලට අවශ්‍ය හෝ ආනුෂංගික විය හැකි හෝ පහසුකම් නැතහොත් සේවාවන් සැලසීමට හෝ සැපයීමට හෝ ඒ පහසුකම් හා සේවාවන් සැලසීම හෝ සැපයීම පහසු කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම.

18. (1) අධිකාරියේ කටයුතු කිරීමට අවශ්‍ය හෝ උපකාරී වන හෝ ආනුෂංගික හෝ සියලු ක්‍රියා හා සියලු පියවර අධිකාරිය විසින් ම හෝ යම් තැනැත්තකු නැතහොත් (සංස්ථාගත වූ හෝ නොවූ) පුද්ගල මණ්ඩලයක් සමග හවුලේ හෝ කිරීමේ හා ගැනීමේ බලය අධිකාරියට ඇත්තේ ය.

අධිකාරියේ බලතල.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, පහත සඳහන් දේ කිරීමට අධිකාරියට බලය ඇත්තේ ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම හා තබා ගැනීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපන කිරීම, විකිණීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම ;

(ආ) අධිකාරියේ කටයුතු කිරීමට හා බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන, උපකාරී වන හෝ ආනුෂංගික වන සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට, අධිකාරිය විසින් ම හෝ අධිකාරිය විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් ඇතුළත් වීම සහ අධිකාරිය විසින් ම හෝ අධිකාරිය විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් එම ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) අධිකාරියේ කටයුතු කිරීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන යම් දෙයක් ඉදි කිරීම, නිෂ්පාදනය කිරීම, මිලට ගැනීම, නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම ;

(ඈ) අධිකාරියේ කටයුතු කිරීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන යම් ද්‍රව්‍ය, උපකරණ හෝ යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම සහ සැපයීම ;

(ඉ) අධිකාරියේ කටයුතු කිරීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන වැඩ කිරීම සඳහා තැනැත්තන් පුහුණු කිරීම හෝ ඒ තැනැත්තන් පුහුණු කිරීමට මුදලින් ආධාර දීම ;

(ඊ) අධිකාරියේ කටයුතු කිරීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන කවර අන් දමක හෝ සේවාවන් සැපයීම ;

(උ) අධිකාරිය විසින් කරන ලද සේවාවන් සඳහා හෝ සපයන ලද පහසුකම් හෝ උපකරණ සඳහා ගාස්තු සහ වෙනත් අයකිරීම් අයකර ගැනීම ;

(ඌ) මල්බෙරි සහ වෙනත් පටපණු ආහාර ශාක වගා කිරීමෙහි ද පටපණුවන් ඇති කිරීමෙහි ද පටපණු පිලා කෝෂ නිෂ්පාදන යෙහි ද පටනූල් එතිමෙහි, ඇඹරීමෙහි සහ කැටීමෙහි ද පටරෙදි විවීමෙහි, පාට කිරීමෙහි සහ වෙනත් ක්‍රමවලින් නිමකම් කිරීමෙහි ද පටරෙදි නිෂ්පාදන සහ ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමෙහි ද නිරත යම් තැනැත්තකුට හෝ (සංස්ථාගත වූ හෝ නොවූ) පුද්ගල මණ්ඩලයකට හෝ ණය මුදල් දීම, ණය සහතික කිරීම, ආධාර මුදල් සහ ප්‍රදාන දීම ආදිය මගින් වූ මුදල් ආධාර ඇතුළු ව ආධාර සැපයීම ;

(එ) පටපණු බීජ, පටපණු පිලා කෝෂ, අමු පට, පටරෙදි, ඇඹරූ පටනූල්, කටින ලද පටනූල්, ඉවත ලන පටනූල් සහ පටරෙදි නිෂ්පාදන ද ආශ්‍රිත නිෂ්පාදන ද මිලට ගැනීම, විකිණීම සහ අන්‍යාකාරයකින් අලෙවි කිරීමෙහි යෙදීම ;

(ඒ) අධිකාරියේ කටයුතු කිරීමට සහ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන නිලධර යන්, සේවකයන් සහ නියෝජිතයන් පත් කිරීම, සේව යෙහි යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් පාලනය කිරීම ;

(ඔ) අධිකාරිය විසින් සේවයේ යොදවන හෝ අධිකාරිය යටතේ සේවය කරන තැනැත්තන් සඳහා මුදල් ආධාර, සුභසාධක සහ විනෝද පහසුකම්, නිවාස, නේවාසිකාගාර සහ වෙනත් එවැනි ඉඩ පහසුකම් සැපයීම ;

(ඕ) අධිකාරියේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට යටත් ව රීති සෑදීම ; සහ

(ක) (i) අධිකාරියේ කටයුතු කිරීමට හෝ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන යම් කරුණක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් නිශ්චිත ව නියම කරනු ලබන ආකෘතියකට අනුව සහ එසේ ම නියම කරනු ලබන තොරතුරු ඇතුළත් ව සත්‍ය වූත් නිවැරදි වූත් වාර්තා තබා ගන්නා ලෙස කවර හෝ තැනැත්තකුට නියම කිරීම ;

(ii) අධිකාරියේ කටයුතු කිරීමට හෝ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන හෝ උපකාරී වන හෝ ආනුෂංගික වන යම් කරුණක් සම්බන්ධයෙන් යම් තැනැත්

තකුගේ දැනිම අනුව සියලු වාර වාර්තා, තොරතුරු සහ පැහැදිලිකිරීම්, නියමිත කාල සීමාවක් ඇතුළත සපයන ලෙස කවර හෝ තැනැත්තකුට නියම කිරීම ;

(iii) (i) වන අනුඡේදය යටතේ තබා ගෙන ඇති වාර්තාවක ඇතුළත් කර තිබෙන හෝ (ii) වන අනුඡේදය යටතේ සපයන ලද යම් වාර වාර්තාවක තොරතුරක නැතහොත් පැහැදිලිකිරීමක දැක්වෙන හෝ යම් කරුණක් හරි වැරදි බැලීමේ කාර්යය සඳහා, අධිකාරියට අවශ්‍ය විය හැකි යම් ලිඛිත හෝ අන් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස නැතහොත් ඉදිරිපත් කරවන ලෙස කවර හෝ තැනැත්තකුට නියම කිරීම ;

(iv) යම් වාර්තා පරීක්ෂාකර බැලීමේ සහ ඒවායේ හරි වැරදි බැලීමේ කාර්යය සඳහා හෝ (i) වන සහ (ii) වන අනුඡේද යටතේ අධිකාරිය වෙත සපයන ලද යම් කිසි වාර වාර්තාවක හෝ ඒ අනුඡේද යටතේ අධිකාරියට දෙන ලද යම් තොරතුරක නැතහොත් පැහැදිලිකිරීමක සපයා ඇති යම් විස්තරයක හරි වැරදි බැලීමේ කාර්යය සඳහා කවර හෝ යුක්තිසහගත වේලාවක කවර හෝ ඉඩමකට, ගොඩනැගිල්ලකට, කාර්යාලයකට, ගබඩාවකට, කර්මාන්ත ශාලාවකට, මඩුවකට හෝ ස්ථානයකට ඇතුළු වී ඒවා පරීක්ෂා කිරීම.

(3) (2) වන උපවගන්තියේ (ක) ඡේදයෙහි (i) වන අනුඡේදයේ හෝ (ii) වන අනුඡේදයේ හෝ (iii) වන අනුඡේදයේ හෝ විධිවිධාන පිළිපැදීම යුක්තිසහගත හේතුවක් නොමැති ව පැහැර හරින හෝ දැන දැනම අසත්‍ය වාර්තා තබාගන්නා හෝ අසත්‍ය වාර වාර්තා, තොරතුරු, පැහැදිලිකිරීම් නැතහොත් ලිඛිත හෝ අන් සාක්ෂි සපයන හෝ (2) වන උපවගන්තියේ (ක) ඡේදයේ (iv) වන අනුඡේදයෙන් අධිකාරිය වෙත පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදවීමෙහි ලා අධිකාරියට අවහිර කරන හෝ සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

## III වන කොටස

### අධිකාරියේ මුදල් සහ ගිණුම්

19. (1) අධිකාරියේ ආරම්භක ප්‍රාග් ධනය රුපියල් පනස් ලක්ෂයක් වන්නේ ය. අධිකාරියේ ප්‍රාග්ධනය.

(2) අධිකාරියේ ප්‍රාග් ධනය, අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු ව නිශ්චය කරනු ලබන්නා වූ ද එකී ප්‍රාග් ධනය වැඩි කර අධිකාරියට ගෙවීම සඳහා ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරනු ලබන යෝජනාවක් මගින් බලය දෙනු ලබන්නා වූ ද යම් මුදල් ප්‍රමාණයකින් කලින් කල වැඩි කරනු ලැබිය හැකිය.

අධිකාරියේ මුදල් වර්ෂය.

**20.** අධිකාරියේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ ජනවාරි මාසයේ පළමුවන දින ආරම්භ වී ඒ වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයෙන් අවසන් වේ.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අදාළ වීම.

**21.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, අධිකාරියේ මුදල් පාලනය සහ ගිණුම් කෙරෙහි අදාළ වන්නේය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

නියෝග.

**22.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කරනු ලැබූ දිනයෙහි සිට හෝ එහි නිශ්චිත ව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක වන්නේය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ පසු හැකි තාක් ඉක්මණින්, අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන්නේය.

(3) මේ පනත යටතේ සාදන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරන හෝ උල්ලංඝනය කිරීමට තැත් කරන හෝ කවර වුවද තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේය.

460 වන අධිකාරය වන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

**23.** (1) අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ ඉඩමක් නොවන යම් ඉඩමක් හෝ යම් ඉඩමක සම්බන්ධතාවක් හෝ අත්කර ගැනීම අවශ්‍ය වූ විටක අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ඒ යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලැබිය හැකිය. එවැනි නියමයක් එසේ ප්‍රසිද්ධ කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉඩම හෝ ඉඩමට ඇති සම්බන්ධතාව පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සැලකිය යුතු අතර ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ එය අත්කර ගෙන අධිකාරිය වෙත පැවරිය හැකිය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු යම් මුදලක් අධිකාරිය විසින් ගෙවිය යුතුය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

**24.** (1) රාජ්‍ය සේවයේ කවර හෝ නිලධරයකු අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා භාරයේ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇති ව, එවැනි ම කැමැත්ත ඇති ව අධිකාරිය විසින්

නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබිය හැකිය; නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලික ව පත් කරනු ලැබූ අවස්ථාවක 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 44 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන හැර ඒ වගන්තියේ අනිකුත් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර ව පත් කරනු ලැබූ අවස්ථාවක, 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 44 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති කවර හෝ තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් අධිකාරිය යටතේ සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා, ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබේ.

25. (1) (අ) අධිකාරිය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධ ව; හෝ

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය යටතේ හෝ කරන ක්‍රියා සඳහා ආරක්ෂාව.

(ආ) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ ව

කිසිදු සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පැවරිය නොහැකිය.

(2) අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධ ව හෝ යම් අධිකරණයක් ඉදිරිපිටට ගෙනෙනු ලබන යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවකදී අධිකාරිය වෙත ගෙවනු ලැබූ හෝ අධිකාරිය විසින් අයකර ගන්නා ලද හෝ යම් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය යටතේ හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී ඔහුට

විරුද්ධ ව ගෙනෙනු ලබන යම් සිවිල් නඩුවක දි හෝ අපරාධ නඩුවක දී ඔහුට දරන්නට සිදුවන යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බව අධිකරණය තීරණය කරත හොත්, ඒ වියදම් අධිකාරිය විසින් ඒ තැනැත්තාට අත්තිකාරම් වශයෙන් දී ඇත්නම් මිස හෝ ඒ තැනැත්තා විසින් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවෙහි දී හෝ ඒ වියදම් ආපසු අයකර ගෙන ඇත්නම් මිස අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතුය.

අධිකාරියේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපලවලට විරුද්ධ ව කිසිදු රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**26.** අධිකාරියට විරුද්ධ ව ගෙනෙනු ලබන යම් නඩුවකදී අධිකාරියේ සාමාජිකයකුට විරුද්ධ ව හෝ ඔහුගේ දේපලවලට විරුද්ධ ව හෝ කිසිදු රිට් ආඥාවක් නිකුත් නොකළ යුතුය.

වැරදි.

**27.** මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට හය මාසයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

දුෂ්කරතා ලිහිල් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

**28.** මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක හෝ නියම කර තිබෙන යම් විධිනාවක් පිළිපැදීම මේ පනත ක්‍රියාත්මක වීමේ දි යම් තැනැත්තකු විසින් අචේතනාත්මක ව පැහැර හැරීමේ හේතුවෙන්, අමාත්‍යවරයාගේ මතය අනුව ඒ තැනැත්තාට සැලකිය යුතු දුෂ්කරතා ඇති වීමට ඉඩ ඇති අවස්ථාවක් ඇති වුව හොත්, අමාත්‍යවරයා විසින් ඒ දුෂ්කරතාව ලිහිල් කිරීමට හෝ වැළැක්වීමට අවශ්‍ය වන යම් විධාන නිකුත් කළ හැකිය.

අන් සියලු ලිඛිත නීති අභිභවා මේ පනත බල පවත්වන බව.

**29.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපවත්වන්නේ ය. ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ ඒ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන හා අතර යම් ගැටීමක් හෝ නොගැළපීමක් හෝ ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය.

අර්ථ නිරූපණය.

**30.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අමාත්‍යවරයා" යන්නෙන් වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"අමුපට" යන්නෙන් පටපණු පිලා කෝෂයෙන් ලබා ගන්නා තනි පට නූල අදහස් වේ;

"ආශ්‍රිත නිෂ්පාදන" යන්නෙන් මල්බෙරි වලින් හෝ පටපණු ආහාර ශාකවලින් හෝ පට පණුවන්ගෙන් හෝ ලබාගන්නා යම් නිෂ්පාදනයක් අදහස් වන නමුත් අමු පට ඊට ඇතුළත් නොවේ;

"පටපණු බීජ" යන්නට 1974 අංක 36 දරන පටපණු බීජ පනතෙහි දී ඇති අර්ථයම ඇත;

"පටපණු වගාව" යන්නෙන්—

(අ) පටපණුවන් ඇති කිරීමේ කාර්යය සඳහා මල්බෙරි හෝ පටපණු ආහාර ශාක හෝ වගා කිරීම;

(ආ) පටපණු බිත්තර හෝ පටපණු පිලා කෝෂ නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා පටපණුවන් බෝකිරීම සහ ඇති කිරීම; සහ

(ඇ) අමුපට නිෂ්පාදනය සඳහා පටපණු පිලාකෝෂගත නූල් එතීම

අදහස් වේ;

"පටපණුවා" යන්නට 1974 අංක 36 දරන පටපණු බීජ පනතෙහි දී ඇති අර්ථය ම ඇත;

"පට රෙදි" යන්නෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන් හෝ අමු පටවලින් නිෂ්පාදිත රෙදි පිළි අදහස් වේ;

"පිලා කෝෂ" යන්නට 1974 අංක 36 දරන පටපණු බීජ පනතෙහි දී ඇති අර්ථය ම ඇත.